කුරුණෑගල මහා නගර සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 09 දින සභාවේ නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 මතය

මගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, කුරුණෑගල මහා නගර සභාවේ 2012 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31දිනට කුරුණෑගල මහානගර සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබද තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). මූල්‍ය ප්‍රකාශන වලට ජ'නල් සටහන් 30 ක් මගින් රු.මිලියන 373 ක් පමණ ගැලපුම් සිදුකර පැවතියද, එකී ජ'නල් සටහන් සඳහා අනුමැතිය ලබා නොතිබීම, ජ'නල් වවුචර් භාවිතා කර නොතිබීම, ජ'නල් සටහන් අංක කර නොතිබීම, අදාල ලෙජර් ගිණුම් වලට යොමුව දක්වා නොතිබීම වැනි අඩුපාඩු පැවතුණි. එමෙන්ම රු.123,446,732 ක් වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන සමඟ උපලේඛණ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ). මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛණ අනුව වියදම් ණයහිමි ශේෂය රු.42,408,108 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු.36,420,061 ක් ලෙස රු.5,988,047 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ). සභාව විසින් පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.50,549,243 ක් ණය හිමියන් යටතේ හා වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.117,136 ක් වූ වියදමක් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ). ලේඛණ අනුව අයවිය යුතු හිඟ වාහන නැවතුම් ගාස්තුව රු.2,850,000 ක් හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.217,757,058 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.66,330,174ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.57,621,426 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). මූල්‍ය ප්‍රකාශන වල රු.40,457,610 ක් ලෙස දක්වා තිබූ ණයහිමි ශේෂය කලින් හඳුනාගැනීමකින් තොරව 2012 වර්ෂය වෙනුවෙන් 2013 වර්ෂයේදී කරන ලද ගෙවීම් පදනම් කරගෙන ණය හිමියන් ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ඉකුත් වර්ෂයට අදාලව වියදම් ණයහිමි යටතේ අතිරික්තව වෙන්කර තිබූ රු.14,604,831 ක් කපා හැර තිබුණි.

(ආ). අයවීම හිඟ හිටි සේවක ණය ශේෂය රු.2,619,432 ක් වූ අතර ඉන් රු.481,391 ක් අවුරුදු තුනට වඩා වැඩි හිඟ හිටි ණය ශේෂ විය.

(ඇ). බැංකු ගිණුම් 3 කට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව අවස්ථා 109 ක් යටතේ රු.431,875 ක හඳුනා නොගත් ලැබීම් හා අවස්ථා 22 ක් යටතේ රු.138,382 ක හඳුනා නොගත් ගෙවීම් සහ අවස්ථා 168 ක් යටතේ රු.3,087,436 ක උපලබ්ධි නොවූ ලැබීම් ලෙස නිරවුල් නොකරන ලද ශේෂයන් පැවතුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත<br>රු. 000 | තථ්‍ය<br>රු. 000 | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය<br>රු. 000 |
|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 83,640 | 59,289 | 24,350 |
| (ii) | බදුකුලී | 56,131 | 51,621 | 4,509 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 8,527 | 8,527 | - |
| (iv) | වෙනත් ආදායම් | 311,570 | 268,974 | 42,596 |

2.3.2 වරිපනම් බදු

වාර්ෂිකව රු.මිලියන 30 ක් පමණ වූ වරිපනම් බිල් කිරීම් යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට හිඟය රු.24,350,468 ක් විය. 2002 ට පෙර රු.773,600 ක්ද, 2002 සිට 2006 කාලයට අදාලව රු.2,318,660 ක්ද, 2007 හා 2010 කාලයට අදාලව රු.8,826,927 ක්ද ලෙස දීර්ඝ කාලීනව අයනොවී පැවත එන හිඟ ශේෂයන් පැවතුණි.

2.3.3 බදුකුලී

කුරුණෑගල දඹුලු පාරේ අංක 01 ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ලක්, හෝටලයක් පවත්වාගෙන යාම සඳහා බදුදී තිබූ අතර, අදාල බදුගිවිසුම ප්‍රකාරව සියළුම අළුත්වැඩියාවන් බදුගැණුම්කරු විසින් සිදුකිරීමට එකඟවී 2012 මැයි 31 දිනට පෙර රු.853,222 ක ඇස්තමේන්තු ගත අළුත්වැඩියාවක් කළයුතු බව දක්වා තිබුණද එකී අළුත්වැඩියාවන් සිදුකර නොතිබුණි.

2.3.4 කඩකුලී

පොදු වෙළඳපල කඩ කාමර 02 ක් 2007 වර්ෂයේ සිටම බදු දීමට නොහැකි වූ අතර, එකී කඩ කාමර වලට අදාලව අවම ලංසුව සැලකූ විට අයකරගත හැකිව තිබූ ආදායම රු.3,564,000 ක් පමණ විය. එමෙන්ම කඩ කුලී යටතේ බස්නැවතුම්පල කඩ කාමර 13 කට අදාලව රු.1,635,634 ක හිඟයක් පැවතිණි.

2.3.5 දැන්වීම් පුවරු ගාස්තු

2012 අගෝස්තු 28 දින 5(14) දරණ සභා සම්මුතිය යටතේ දැන්වීම් පුවරු සහ බැනර් සඳහා ගාස්තු අයකරගෙන තිබුණි. දැන්වීම් පුවරු වල කාලය දීර්ඝ කර නොගැනීම හේතුවෙන් අවස්ථා 6 කට අදාලව රු.488,495 ක් ලෙස අයකර ගත හැකිව තිබූ දැන්වීම් පුවරු ගාස්තුවක් නොලැබී තිබුණි. එමෙන්ම 2011 වර්ෂයේ සිට පැවත එන අයකරගත යුතු රු.109,465 ක හිඟ දැන්වීම් පුවරු ගාස්තු ශේෂයක් පැවතුණි. සභාව විසින් ප්‍රචාරක දැන්වීම් ගාස්තු අයකර ගැනීමට අදාලව අතුරු ව්‍යවස්ථාවක් පනවාගෙන නොතිබුණි.

2.3.6 ජල ගාස්තු

ජල පාරිභෝගික සංඛ්‍යාව වූ 7129 න් 13% ක් ලෙස ජල පාරිභෝගිකයින් 923 ක් සඳහා සාමාන්‍ය පාරිභෝජන ඒකක ප්‍රමාණය මත ජල ගාස්තු ගණනය කරමින් පැවතුණි. සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව පුබුදු මාවත මුළු පාරිභෝගික සංඛ්‍යාව වූ 86 න් 25% ක් ලෙස පාරිභෝගිකයින් 22 ක් සඳහා වසරකට වැඩි කාලයක සිට සාමාන්‍ය පාරිභෝජන ලීටර් ප්‍රමාණය මත ගාස්තු ගණනය කර තිබුණි.

2.3.7 ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු

සභා බල ප්‍රදේශය තුල පවතින ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය ලියාපදිංචි හෝටල් 3 කින් මහානගර සභා ආඥා පනතේ 247(අ) වගන්තිය අනුව පිරිවැටුම මත 1% කට නොවැඩි වන ගාස්තුවක් අයකර ගත හැකි වුවද, සභාව විසින් වෙළඳ බලපත්‍ර ගාස්තු තක්සේරුව මත ගාස්තු අයකිරීම කර තිබුණි.

2.3.8 දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා පෙරසැරි ගාස්තු

සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත දුරකථන සම්ප්‍රේෂණ කුළුණු පිළිබඳ සමීක්ෂණයක් සිදුකර හඳුනා ගැනීමක් හෝ ඒවාට අදාලව පෙරසැරි ගාස්තු, බලපත්‍ර ගාස්තු හෝ වෙනත් ගාස්තු අයකිරීමක් කර නොතිබුණි.

2.3.9 වාහන නවතා තැබීමේ ගාස්තු

සභා බල ප්‍රදේශයේ වාහන නැවැත්වීමට අදාලව අතුරු ව්‍යවස්ථාවක් පැවතියද, ත්‍රීරෝද රථ නැවැත්වීමට අදාලව වාර්ෂිකව හෝ කාලානුරූපීව සමීක්ෂණයක් කර ත්‍රීරෝද රථ ලියාපදිංචිය හෝ 2006 අගෝස්තු 30 දිනැති ම.න.ස 05(45) සභා තරණය පරිදි ගාස්තු අයකිරීමක් සිදුකර නොතිබුණි.

2.4 වාහන උපයෝජනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ධාවන සටහන් අනුව කුඩා ගලිරථය සඳහා 2012 ජනවාරි - සැප්තැම්බර් කාලපරිච්ඡේදය තුලදී ඉන්ධන ලීටර 150 ලබාගත් බව සටහන් කර තිබූ අතර බඩු බාහිරාදිය නිකුත් කිරීමේ කුවිතාන්සි හා ඉන්ධන බිල්පත් පියවීමේ ලේඛණය අනුව අදාල කාලය තුල ඉන්ධන ලීටර 610 ක් නිකුත් කර තිබුණි. ඒ අනුව ගලි රථය සඳහා නිකත් කල ඉන්ධන ප්‍රමාණය අතර ලීටර 460 ක වෙනසක් පැවතුණි.

(ආ). අංක 43-2882 දරණ ගලි රථය සඳහා ගබඩාවෙන් නිකුත් කල ඉන්ධන ප්‍රමාණයන් හා ධාවන සටහන් වල ඇතුලත් කල ඉන්ධන ප්‍රමාණයන් අතර 2012 වර්ෂයේ පෙබරවාරි-ඔක්තෝබර් කාලයට අදාලව ලිටර් 230 ක වෙනසක් පැවතුණි.

2.5 අවිධිමත් ගනුදෙනු

හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා ආදායම් පරිපාලකවරයෙකු හා එකී තනතුරේ රාජකාරි ඉටුකරන සභා සේවකයන් 04 දෙනෙකු වෙත එකතු කරනු ලබන මුදල මත 3% ක කොමිස් මුදලක්ද, 8% ත් 12% ත් අතර පරාසයක් යටතේ කොමිස් පදනම මත සේවයේ යොදවා ගත් පුද්ගලයන් තිදෙනෙකු වෙනුවෙන් පිළිවෙලින් 2012 පළමු හා දෙවන කාර්තු වලට අදාලව රු.104,568 ක් හා රු.173,703 ක් ගෙවා තිබුණද ගෙවීම් සඳහා වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ 1987 ඔක්තෝබර් 05 දිනැති අංක U1/Gen/7(1) දරණ ලිපිය අනුව අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

2.6 <u>වත්කම් කළමනාකරණය</u>

සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව මෝටර් රථ හා කරත්ත ඒකක 70 ක් පැවති අතර ඉන් මෝටර් රථ හා කරත්ත ඒකක 43 ක් රු.93,136,029 කට වටිනාකම් කර දක්වා තිබූ අතර, ඉතිරි මෝටර් රථ හා කරත්ත වල අගය ගණනය කර නොතිබුණි.

2.7 <u>මානව සම්පත් කළමනාකරණය</u>

පහත කරුණු නිරික්ෂනය කරනු ලැබේ.

(අ). සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 470 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 375 ක් වූයෙන් පුරප්පාඩු 96 ක් හා අතිරික්ත 1 ක් පැවතුණි. මීට අමතරව අනියම් හා ආදේශක පදනම මත සභා අරමුදලින් වැටුප් ලබන සේවකයින් 192 දෙනෙකු සේවයෙ යොදවා තිබුණි.

(ආ). අනුමත සේවක සංඛ්‍යාව යටතේ කාර්මික නිලධාරි තනතුරු 08 න් 03 ක්ද, ආදායම් පරිපාලක තනතුරු 02 න් 01 ක්ද, පුස්තකාලාධිපති තනතුරු 04 න් 01 ක් ද පුරප්පාඩුවද, වෛද්‍ය නිලධාරි තනතුරක් අතිරික්තවද පැවතුණි. එමෙන්ම කුරුණෑගල මහජන පුස්තකාලයට අදාලව තනතුරු නාම 6 ක් යටතේ පුරප්පාඩු 14 ක් පැවතුණි.

(ඇ). නගරාධිපතිතුමාගේ පුද්ගලික කාර්ය මණ්ඩලයේ ලේකම් තනතුර සඳහා 2011 නොවැම්බර් 22 දිනැති අංක 05 (31) සභා සම්මුතිය අනුව මාසිකව රු.20,000 ක දීමනාවක් මත පුද්ගලයෙකු බඳවාගෙන ගෙවීම් කර තිබුණි. එහෙත් වයඹ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩල තීරණ අංක - 05/අමා/2012/48 අනුව මෙවැනි පත්වීමක් සඳහා ගෙවිය හැකි මාසික දීමනාව රු.8,000 ක් ලෙස දක්වා තිබුණි. මහානගර සභා ආඥා පනතේ 40 වගන්තියේ 1(අ) සහ (ආ) අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව මෙම දීමනාව ගෙවා ඇතිබව නාගරික කොමසාරිස් 2013 සැප්තැම්බර් 08 දින මා වෙත දන්වා තිබුණි.

2.8 <u>සභාව විසින් ආරම්භ කර ඇති නෛතික කරුණු</u>

(අ). පොදු වෙළඳපල අංක 03 කඩ කාමරයට අදාලව 2004 වර්ෂයට අදාල රු.291,389 ක හිඟ මුදල අයකර ගැනිම සඳහා සභාව විසින් 2006 නොවැම්බර් මාසයේදී නඩු පවරා තිබු අතර, 2007 සැප්තැම්බර් දක්වා මාසිකව රු.10,000 බැගින් වාරික අයවී තිබුණි. තවදුරටත් අයවිය තිබූ රු.191,389 ක මුදල අයකර ගැනීමට සභාව විසින් ගත් ක්‍රියාමාර්ග අනාවරණය නොවුණි.

(ආ). පොදු වෙළඳපල අංක 02 කඩ කාමරයට අදාලව 2005 වර්ෂයට අදාල රු.405,959 ක හිඟ කඩකුලි මුදල අයකර ගැනිම සඳහා 2006 සැප්තැම්බර් මාසයේදී නඩු පවරා තිබු අතර, රු.10,000 බැගින් 2008 සැප්තැම්බර් දක්වා වාරික අයවී තිබූ අතර, තවදුරටත් අයවිය යුතු රු.195,959 ක මුදල අයකර ගැනීමට සභාව විසින් ගත් ක්‍රියාමාර්ග අනාවරණය නොවුණි.

(ඇ) පොදු වෙළඳපල අංක 01 කඩ කාමරයේ 2006 හා 2007 වර්ෂ වල රු.191,751 ක් වූ හිඟ සඳහාද අංක 03 කඩ කාමරයේ 2006 වර්ෂයට අදාලව රු.125,308 ක් වූ හිඟ සඳහාද අංක 5 කඩ කාමරයේ 2006

වර්ෂයට අදාල රු.85,460 ක හිඟ සඳහාද අංක 04 කඩ කාමරයේ 2006 වර්ෂයට අදාල හිඟ සඳහාද 2010 වර්ෂය වන විට නඩු පවරා ඇති බව වාර්තා කළද, අදාල ලිපිගොනු විගණන කාල පරාසය තුල ඉදිරිපත් නොවූ අතරම එම නඩුවල ඉදිරි ප්‍රගතියද හඳුනාගත නොහැකි විය.

(ඈ). හිඟ ජල ගාස්තු රු.252,487 කට අදාල නඩු 03 ක් වර්ෂය අවසානය වන විටද අවසන්ව නොතිබුණි.

2.9 කොන්ත්‍රාත් පරිපාලනය

රු.මිලියන 40 පමණ වැයක් දරා තිබූ වැහැර ව්‍යාපාර සංකීර්ණයක් හා නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට අදාලව, ඉදිකිරීම වෙනුවෙන් 53% දායකය ලෙස ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගත් රු.මිලියන 21 ක් පමණ වූ ණය මුදල සඳහා රු.2,131,872 ක ණය පොලියක් 2012 දෙසැම්බර් 31 වන විට ගෙවීමට සිදුව තිබුණි. ඉදිකිරීම් කටයුතු 2012 ජූනි මාසයේදී අවසන් වී තිබූ අතර ගොඩනැගිල්ලෙන් අඩක් පමණ නිශ්චිත කාර්යයකට යොදවා නොතිබුණි. එමෙන්ම අතිරේක වැඩ වෙනුවෙන් රු.2,372,755 ක් පමණ වැයකර තිබූ අතර ආසන්න මාර්ග පුළුල් කිරීම හේතුවෙන් එකී අතිරේක ඉදිකිරීම් ඉවත් කිරීමේ අවදානමකට ලක්ව තිබුණි.

2.10 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂනය කරනු ලැබේ.

(අ). පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.50,549,243 ක් තිබුණි.

(ආ). මහනගර සභාව විසින් කුලියට දෙනු ලබන නව සාප්පු සංකීර්ණයෙහි 2012 ජනවාර්-ජූනි කාලයට අදාලව විදුලිය වියදම රු.8,148,188 ක්ද, වැටුප් හා අතිකාල දීමනා ලෙස රු.986,466 ක්ද, පවිත්‍රතා කටයුතු සඳහා රු.210,000 ක් ලෙස පුනරාවර්ථන, මෙහෙයුම් වියදම් රු.9,344,654 ක් පමණ දරා තිබූ අතර, නඩත්තු කටයුතු සඳහා එකී කාලයට අදාලව රු.148,430 ක් වැයකර තිබුණි. එහෙත් මෙකී කාලයට අදාලව වෙළඳ සංකීර්ණයේ කඩ වෙනුවෙන් බිල්කල හැකි ආදායම රු.9,459,600 ක් පමණ විය. ඒ අනුව අදාල මෙහෙයුම් වියදම් සමඟ සැසඳීමේදී සාප්පු සංකීර්ණයෙන් ප්‍රමාණාත්මක ආදායමක් නගර සභා අරමුදලට උත්පාදනය වීමක් සිදුව නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ). වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඊ) වාහන උපයෝජනය